# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2304/87 – 2022 නොවැම්බර් 05 වැනි සෙනසුරාදා – 2022.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/331.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වයි. ජයරත්න මයා, අංක 29/1, කොකරකන්ද, ඇත්කඳුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පීඑල්සී, 9 වන මහල, එයිට්කන් ස්පෙන්ස් ටවර් 01, අංක 305, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
2. ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පීඑල්සී, දිවිතුර වතුයාය, ඇත්කඳුර.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, මිහිදුපුර, දම්මෝදය මාවත, අංක 13/1127, සරත් චන්ද්‍රසිරි විතාන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/03/2019/331.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වයි. ජයරත්න මයා, අංක 29/1, කොකරකන්ද, ඇත්කඳුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පීඑල්සී, 9 වන මහල, එයිට්කන් ස්පෙන්ස් ටවර් 01, අංක 305, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
2. ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පීඑල්සී, දිවිතුර වතුයාය, ඇත්කඳුර.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පීඑල්සී සමාගමට අයත් ඇත්කඳුර දිවිතුර වතුයායේ සේවය කළ (2011.08.20 සිට 2018.11.15 දක්වා) වයි. ජයරත්න මහතාට දෛනික කම්කරු වැටුප ලබා දුන්න ද, රියදුරු වැටුපට හිමිකමක් පවතින බවට කරන ඉල්ලීම අනුව රියදුරු වැටුප හිමි ද යන්නත් හිමි නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳවයි.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0059

මගේ අංකය: IR/COM/01/2019/349.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය සංගමය - සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගොතටුව නව නගරය, කජුගහවත්ත, පෙට්‍රල් ෂෙඩ් ඉදිරිපිට පාර, අංක 16 හි, නීතිඥ විජිතානන්ද මඩවලගම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/01/2019/349.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය සංගමය - සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''2002 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පැවති නිවාඩු දින දීමනා ගෙවීමේ ක්‍රමවේදය වෙනස්කොට 2019 වර්ෂයේ දී නව ක්‍රමවේදයක් හඳුන්වාදීම මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවය කරන මාණ්ඩලික නිලධාරීන්ට යම් අසාධාරණයක් සිදු වී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0060

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.